## 2. ශ්‍රී ලංකාවේ ජනාවාස වීම.

1) I. ශ්‍රී ලංකාවේ ජනාවාස වීම හා සම්බන්ධ ප්‍රධාන අවධි තුනක් නම් කරන්න.

II.ගල් යුගයට අයත් ප්‍රජාව ජීවත්ව සිටි ප්‍රධාන පරිසර කලාප හතරක් නම් කරන්න.

III.ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් අභිචාර විධි පිළිබඳ හමු වී ඇති සාක්ෂි තුනක් ඉදිරිපත් කරන්න.

IV.ගල් යුගයේ සිටි මානවයාගේ ආහාර රටාවේ ස්වභාවය පිළිබඳව කරුණු දෙකක් මඟින් විස්තර කරන්න.

2) I. ශිලා මංජුසා සොහොන් පැවති බවට සාක්ෂි ලැබී ඇති ස්ථාන තුනක් නම් කරන්න.

II. මුල් ඓතිහාසික යුගයට අයත් වාපීගාම හතරක් සඳහන් කරන්න.

III. පූර්ව ඓතිහාසික යුගයේ මිනිසුන්ගේ කැපී පෙනෙන පරිවර්තනීය ලක්ෂණ තුනක් සඳහන් කර තුනෙන් එකක් විස්තර කරන්න.

IV."මුල් යකඩ යුගයට අයත් මිනිසුන්ගේ ජීවන රටාව පිළිබඳ රත්නපුර දිස්ත්‍රික්කයේ උඩ රංචාමඩම ප්‍රදේශයෙන් සාක්ෂි රැසක් කැණීම්වලින් සොයා ගෙන ඇත." මෙය කරුණු දෙකකින් විස්තර කරන්න.